# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2018 පෙබරවාරි මස 20 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**
**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.40 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු හෙක්ටර් බෙත්මගේ | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු චන්දන ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අශෝක දයාරත්න
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇන්ටනී උපුල් රාජිත
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදාර රත්නායක
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.එම්. සකාවුල්ලා
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කාමල් කුරුප්පු
කිත්සිරි කහටපිටිය
කිත්සිරි මංචනායක
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩි තේවර්
ක්‍රිෂාන්ත යෝගදාස් පංචරත්නම් රාම්
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
ගුණසිරි ජයනාත්
චන්ද්‍රසෝම සරණලාල්
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆයිරුස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
රන්දීර් රොද්‍රිගෝ
රවී විජේසේකර
රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
සරත් පතිරණ
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සිරිකමල් පිලීෂියන් ද සිල්වා
සුනිල් ජයමිණි
සුනිල් වටගල
සුමිත් විජයමුණි ද සොයිසා
සුසාර දිනාල්
සුසිල් කිඳෙල්පිටිය
සෙනල් වෙල්ගම
ශිරන්ත අමරසේකර
හරිස්චන්ද්‍ර කොස්තා

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

ඉන්දික බණ්ඩාර
උදේන විජේරත්න
එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය
කේ.ඩී. අරුණ දීපාල්
නිරෝෂන් පාදුක්ක
මංජුල බුද්ධදාස
රජිත හපුආරච්චිගේ
රවීන්ද්‍ර යසස් කුමානායක
රොජර් සෙනෙවිරත්න
ලයනල් ජයසිංහ
විජිත් ප්‍රියන්ත
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
ශ්‍රීනාත් පෙරේරා

01. **අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා දීම්/දිවුරුම් දීම් :**

*"මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමා සහ රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා පළාත් සභා මන්ත්‍රී ධූරවලින් ඉල්ලා අස්වීම හේතු කොට ගෙන ඇති වූ මන්ත්‍රීධූර පුරප්පාඩු සඳහා පිළිවෙළින් ගරු උතුවන්පතිරන්නැහැලාගේ චන්ද්‍රසෝම සරණලාල් මැතිතුමා [ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය] සහ ගරු කිත්සිරි මංචනායක මන්ත්‍රීතුමා [ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය] පළාත් සභා මන්ත්‍රීවරුන් ලෙස තේරී පත් වී ඇති බවත්, ඒ අනුව, චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමා 2018.01.25 දින ද, කිත්සිරි මංචනායක ගරු මන්ත්‍රීතුමා 2018.02.16 දින ද තමන් ඉදිරියේ නිල ප්‍රතිඥාව/දිවුරුම දීමද*[1] *සිදු කරනු ලැබූ බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

***අනතුරුව, අභිනවයෙන් පත් වූ ගරු මන්ත්‍රීවරුන් ගරු සභාපතිතුමා විසින් කරන ලද කැඳවීම අනුව සභා ගර්භයේ වෙන් කර තිබූ ආසනවල අසුන් ගන්නා ලදී.***

## 02. සභාපතිවරයාගේ නිවේදන :

*i*

*"උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාට ඇති වූ පාදයක ආබාධයක් හේතු කොට ගෙන වූ අපහසුතාවයන් නිසා, පළාත් සභා රැස්වීමට රෝද පුටුවක් උපයෝගී කර ගෙන පැමිණීමටත්, ආසනය සුදුසු පරිදි සකසා දෙන මෙන් ද ලිඛිතව ඉල්ලීමක් කර තිබෙන බවත්, ඒ අනුව එතුමාට ඊට අවසරය ලබා දුන් බවත්, එතුමාට අවශ්‍ය සහයෝගය කාර්ය මණ්ඩලය මගින් මෙන්ම එතුමාගේ ආසන්නයේම සිටින ගරු මන්ත්‍රීවරුන්ගෙන් ද ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*ii*

*උපදේශක කාරක සභා සඳහා පත් කිරීම් :*

*"කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සාමාජික ධූර දෙකක ඇති වූ පුරප්පාඩු සඳහා 2018.02.16 දින සිට යූ.පී. චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමාවත්, 2018.02.20 දින සිට කිත්සිරි මංචනායක ගරු මන්ත්‍රීතුමාවත් නම් කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*iii*

*අයවැය නිල [හැන්සාඩ්] වාර්තා :*

*"2018 වර්ෂය වෙනුවෙන් පැවති 2017 දෙසැම්බර් මස 05, 06 හා 07 යන දිනයන්හි නිල [හැන්සාඩ්] වාර්තා අද දින සභාගත කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 03. විගණකාධිපති වාර්තා :

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින්, "බස්නාහිර පළාතේ ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති වාර්තාවන් සහ, "බස්නාහිර පළාතේ සංචාරක මණ්ඩලයේ විගණකාධිපති වාර්තාවන් මෙන්ම [ගරු රංජිත් සෝමවංශ අමාත්‍යතුමාට අදාළ] "බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ විගණකාධිපති වාර්තාවන් සභාවට පිළිගන්වන ලදී.

***එකී විගණකාධිපති වාර්තාවන් පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් ලේකම්වරයාට දන්වන ලදී.***

---

[1] 2018.02.20 නිල වාර්තාව බලන්න.

## 04. කාරක සභා වාර්තා :

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ (විශේෂ විමර්ශණ) විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් වූ පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

අනතුරුව, ගරු සභාපතිතුමා විසින් 2018.01.15 දින පැවති ප්‍රධාන පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව සහ 2018.01.24 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා වාර්තාව පිළිගන්වන ලදී.

## 05. නොපැමිණ සිටීමේ අවසරය :

*"රවීන්ද්‍ර යසස් ගරු මන්ත්‍රීතුමාට මාසයක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය."*

***පූ.භා. 11.00 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කොරළගේ මහතා] මූලාසනාරූඪ විය.***

## 06. රීති අංක 107 යටතේ යෝජනාව :

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂාංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(1), 15(2), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

## 07. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

*"කේවල හා සමානුපාතික අනුපාතය 60% ක් හා 40% ක් ලෙස වූ මිශ්‍ර ක්‍රමයක් වශයෙන් හඳුන්වා දුන් නව මතිවරණ ක්‍රමයක් යටතේ ප්‍රථම වරට පැවති පළාත් පාලන මැතිවරණයෙහි ප්‍රතිඵලවලට අනුව පළාත් පාලන ආයතන සඳහා බහු පක්ෂ ක්‍රමයක් තුළ නියෝජිතයන් පත්ව ඇති ආකාරය අනුව එම පළාත් පාලන ආයතනයන්හි ස්ථාවර පාලනයක් පිහිටුවීම ප්‍රායෝගිකව දුෂ්කර වී ඇත. පළාත් පාලන මැතිවරණය සඳහා වන එම අනුපාතයන් මත එවැනි දුෂ්කරතාවයන් මතු වීමෙන් හෙළිවන කරුණක් වනුයේ ඉදිරියේ මෙම ක්‍රමය යටතේ පැවැත්වෙන පළාත් සභා මැතිවරණයකදී දැනට යෝජිත පරිදි කේවල හා සමානුපාතික අනුපාතය 50% ක් බැගින් වන සේ වුවහොත් පළාත් සභාවන්හි පාලනය පිහිටුවීමේදී ද දැඩි අස්ථාවර තත්ත්වයකට මුහුණ දීමට සිදු විය හැකි බවය. එබැවින් පළාත් සභා මැතිවරණ ක්‍රමය සකස් කිරීමේදී කේවල හා සමානුපාතික නියෝජනයේ අනුපාතය 70% ක් හා 30% ක් වශයෙන් වන පරිදි එම මැතිවරණ ක්‍රමය සකස් කරන මෙන් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලා සිටී."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***අ.භා. 12.59 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කොරළගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන් ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

***රීති අංක 107 යටතේ ඉදිරිපත් කළ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව පිළිබඳ විවාදය අවසානයේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් බෙදීමක් ඉල්ලා සිටින ලදුව, එවලේ සභාවේ ගණපූරණය සම්පූර්ණව නොපවතින බව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට පෙනී ගියෙන් සභාවේ කටයුතු ඊළඟ සභාවට යොමු කරමින්,***

## 08. 12(1) රීතිය යටතේ කල් තැබීම :

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් 12(1) රීතිය යටතේ පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 01.51 ට, 2018 මාර්තු මස 06 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2018.02.20
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල, බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

අව/20
Minuts 2018.02.20 - Hansard Section